# <u>ටෙන්ඩර් දැන්වීම</u>

**බළන්ගොඩ නගර සභාව සතු දේපල හා සේවා බදුදීම සඳහා සුදුසු බදුකරුවන් තෝරා පත් කර ගැනීමට ටෙන්ඩර් පත් කැඳවීම.**

පහත උප ලේඛන (I) හා (II) විස්තර කරනු ලබන දේපළ හා සේවා බදු දීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ සභාපති නිකලන්ද වත්තේ පේෂල තුෂාර ජයසේන වන මා විසින් 2026 ඔක්තෝම්බර් මස 13 වන දින පෙ.ව.09.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දි කාර්යාලීය දුරකථන අංක 045-4930830 ඇමතීමෙන් හෝ www.balangoda.uc.gov.lk වෙතින් ලබාගත හැකි ය.

**ටෙන්ඩර් පත් නිකුත් කිරිම:**

2026 සැප්තැම්බර් මස 28 දින සිට 2026 ඔක්තෝම්බර් මස 12 වන දින ප.ව. 3.00 දක්වා ටෙන්ඩර් පත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් භාරගැනීම:**

2026 ඔක්තෝම්බර් මස 13 වන දින පෙ.ව. 09.00 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම හෝ සභාපති, බළන්ගොඩ නගර සභාව යන ලිපිනයට 2026 ඔක්තෝම්බර් මස 13 වන දින පෙ.ව. 09.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමු කළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ටෙන්ඩර් පත් විවෘත කිරිම:**

2026 ඔක්තෝම්බර් මස 13 වන දින පෙ.ව. 09.00 ට ටෙන්ඩර් පත් භාර ගෙන අවසන් වූ වහාම ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**උප ලේඛනය (I)**

(2027.01.01 දින සිට 2027.12.31 දින දක්වා වූ වර්ෂයක කාලය සඳහා)

| අනු අංකය | ටෙන්ඩර් පත් කැඳවනු ලබන වෙළෙඳාමේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල (රු) | අයදුම්පත් ගාස්තුව (රු) | අවම මාසික ටෙන්ඩර් මුදල (රු) |
|---|---|---|---|---|
| 01. | පොදු වෙළඳසැල අංක 09 දරන මාළු කඩ කාමරය | 5,000.00 | 1,000.00 | 24,550.00 |
| 02. | පොදු වෙළඳසැල අංක 10 දරන මාළු කඩ කාමරය | 5,000.00 | 1,000.00 | 24,550.00 |
| 03. | පොදු වෙළඳසැල අංක 11 දරන මාළු කඩ කාමරය | 5,000.00 | 1,000.00 | 24,600.00 |
| 04. | පොදු වෙළඳසැල අංක 12 දරන මාළු කඩ කාමරය | 5,000.00 | 1,000.00 | 24,600.00 |
| 05. | පොදු වෙළඳසැල අංක 14 දරන මාළු කඩ කාමරය | 5,000.00 | 1,000.00 | 24,600.00 |
| 06. | පොදු වෙළඳසැල අංක 18 දරන මාළු කඩ කාමරය | 5,000.00 | 1,000.00 | 36,600.00 |
| 07. | පොදු වෙළඳසැල අංක 15 දරන එළු මස් කඩ කාමරය | 10,000.00 | 1,000.00 | 24,750.00 |
| 08. | පොදු වෙළඳසැල අංක 16 දරන එළ හරක් මස් කඩ කාමරය | 100,000.00 | 1,000.00 | 499,000.00 |
| 09. | පොදු වෙළඳසැල අංක 17 දරන කුකුළු මස් කඩ කාමරය | 10000.00 | 1,000.00 | 26,000.00 |
| 10. | බළන්ගොඩ නගරයට රථවාහන ඇතුළුකිරීම හා නැවතුම් ගාස්තු අය කිරීම | 20,000.00 | 1,000.00 | 200,000.00 |

## උප ලේඛනය (II)

බළන්ගොඩ නගරය පිරිසිදු කිරීම, කැළිකසල ඉවත් කිරීම, බැංකියවත්ත කසල කළමණාකරණ මධ්‍යස්ථානය දක්වා ප්‍රවාහනය කිරීම .

(2026.11.01 දින සිට 2027.10.31 දින දක්වා වූ වර්ෂයක කාලය සඳහා)

| අනු අංකය | ටෙන්ඩර් කරනු ලබන සේවාවේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ටෙන්ඩරයේ ඇප තැන්පත් මුදල (රු) | අයදුම්පත්‍ර ගාස්තුව (රු) | අවම මාසික ලංසු මුදල (රු) |
|---|---|---|---|---|
| 11. | බළන්ගොඩ නගර සභාවේ අනුමත වැඩ සැලැස්ම අනුව නගරය පිරිසිදු කිරීම හා කැළිකසල ඉවත් කිරීම. (වැඩ සැළැස්ම ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රය සමග ලබා දෙනු ලැබේ) | 50,000.00 | 2,500.00 | |

**විශේෂ කොන්දේසි:**

- ✓ ටෙන්ඩර් අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ ඉදිරිපත් කළ යුතුය.
- ✓ එක් එක් ටෙන්ඩරය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුතු අතර, ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ තමා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩරයේ නම සඳහන් කළ යුතුය.
- ✓ ඉදිරිපත් කරන ටෙන්ඩරයේ මුදලට හා ඉහත උප ලේඛනයේ සඳහන් ගාස්තු සඳහා රජය විසින් පනවනු ලබන බදු මුදල්ද ගෙවිය යුතුය.
- ✓ අයදුම්පත් ලබා ගැනීමට දිවයිනේ ඕනෑම ප්‍රදේශයක පදිංචිකරුවෙකුට අවස්ථාව පවතින අතර, **එළ හරක් මස්** සහ **එළු මස්** සපයා ගැනීම රජයේ අනුමත ගෝ ඝාතකාගාරයකින් විය යුතුය.
- ✓ සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.
- ✓ නගර පිරිසිදු කිරීමට අදාල කොන්දේසි ටෙන්ඩර් අයදුම්පත්‍ර සමඟ ලබාගත යුතු අතර, එම කොන්දේසි වලට එකඟතාවය ටෙන්ඩර් අයදුම්පත්‍ර සමඟ ඉදිරිපත් කල යුතුය.
- ✓ ටෙන්ඩර් කොන්දේසි සහ විස්තර ටෙන්ඩර් අයදුම් පත්‍රය සමඟ ලබාදෙනු ලැබේ.

2026 සැප්තැම්බර් මස 18 වන දින,
බළන්ගොඩ නගර සභාවේදීය.

එන්.ඩබ්.පී.ටී. ජයසේන ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.